# ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියදුරු (විවෘත) තනතුරු සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය - 2025

# Practical Test for the Recruitment of Grade III Postal Drivers (Open) Posts in the Primary Level Skilled Category of the Postal Department of Sri Lanka – 2025

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියැදුරු තනතුරෙහි පවත්නා පුරප්පාඩු 40ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් තැපැල් මූලස්ථානයේදී පවත්වනු ලැබේ.

**1. භාෂා මාධ්‍ය :**

ප්‍රායෝගික පරීක්ෂණය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**2. බඳවා ගැනීමේ සුදුසුකම් :**

**2.1. අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**2.2. වෘත්තීය සුදුසුකම් :**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල D පන්තියේ (බර වාහන) රියැදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**2.3. පළපුරුද්ද :**

D පන්තියේ (බර වාහන) රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසුව 2025.07.25 දිනට පෙර D පන්තියේ බර වාහන පැදවීම පිළිබඳව වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී සහතික මඟින් සනාථ කළ යුතුවේ.)

**2.4. කායික සුදුසුකම් :**

i. අයදුම්කරුගේ අවම උස අඩි 5 අඟල් 2 ½ කට (සෙ.මී. 157 ) නොඅඩු විය යුතුය.

ii. සෑම අයදුම්කරුවෙක්ම දිවා කාලයේ හා රාත්‍රී කාලයේදී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක, රියැදුරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය. (ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.)

2.5. වෙනත් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත වන බව ග්‍රාම නිලධාරි විසින් සනාථ කළ යුතුය.

iii. පුරුෂ පාර්ශවය පමණක් අයදුම් කළ යුතුය.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු මෙම නිවේදනයේ 02 හා 03 ඡේදයන්හි සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනය වන 2025.07.25 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

3. වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2025.07.25 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අයෙක් විය යුතුය. ඒ අනුව 2007.07.25 දිනට හෝ ඊට පෙර හා 1980.07.25 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.
(දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අයට උපරිම වයස අදාළ නොවේ.)

4. වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025ට අනුව මාසික වැටුප් පරිමාණය රු.42,780 - 10 x 490 - 10 x 540 – 10 x 590 – 12 x 630 – රු. 66540 ක් වේ. (PL 3 -2025 අනුව)

5. බඳවා ගැනීමේ ක්‍රමය :

ප්‍රායෝගික පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.
ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

5.1. ප්‍රායෝගික පරීක්ෂණය

මෙම පරීක්ෂණය සඳහා පහත නිර්ණායකයන් උපයෝගී කර ගනු ලැබේ. පහත සඳහන් පරිදි ලකුණු ලබාගත යුතු අතර සියළු විෂයයන් එක වර සමත් විය යුතුය.

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|---|
| I | රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| II | මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| III | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

6. **අයදුම්කිරීමේ ක්‍රමය :**

**6.1.** මෙම නිවේදනයේ අවසානයට ඇති ආදර්ශ අයදුම්පතට අනුව **A4** ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 05 දක්වා ශීර්ෂ පළමු වන පිටුවෙහිද, ඉතිරිය 2 හා 3 පිටුවලටද, ඇතුළත් වන පරිදි අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් පරීක්ෂණයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යෙදිය යුතුය. අයදුම්පත් තැපැල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන **www.slpost.gov.lk** මගින්ද ලබා ගත හැකිය.

**6.2.** නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.07.25 දිනට පෙර **ජොෂ්ය පාලන ලේකම් (මූලස්ථාන) අංක 310, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ 111 වන ශ්‍රේණියේ තැපැල් රියැදුරු (විවෘත) තනතුර සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය - 2025"** යන්න සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**6.3.** රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් පරීක්ෂණයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින්ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු,කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අනාගාමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**6.4.** නියමිත වයස් සීමාවට අයත් නොවන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා **2025.07.25 දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** අයදුම්පත් ලද බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

7. **ගාස්තු ගෙවීම**

7.1. මෙම පරීක්ෂණය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවකු විසින්ම පරීක්ෂණ ගාස්තු ලෙස රු.500.00ක මුදලක් ගෙවිය යුතුය. එම ගාස්තුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර, තැපැල්පති ආදායම් ශීර්ෂ 2001-02-00 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි එක් දාරයකින් ඇලවිය යුතුය. පරීක්ෂණය සඳහා ගාස්තුව ගෙවන ලද ලදුපත අයදුම්කරුගේ නමින්ම නිකුත් කර තිබිය යුතුය. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

8. ප්‍රතිඵල

තැපැල්පති අනුමැතිය මත ප්‍රායෝගික පරීක්ෂණයෙන් තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඔවුන් වෙත දන්වනු ලැබේ.

9. **සේවයේ නියුක්ත කිරීමේ වගන්ති සහ කොන්දේසි :**

**9.1.** මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

**9.2.** තෝරා ගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක ස්ථිර කර නොසිටී නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීම් කාලයකට යටත් වනු ඇත.

**9.3.** තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**9.4.** තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක රියදුරු තනතුරේ රාජකාරි ඉටු කළ යුතුය. ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

**10.** **සාවද්‍ය තොරතුරු සැපයීම :**

අයදුම්කරු විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවය අවසන් කිරීමට හෝ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**11.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවකදී සිංහල භාෂා මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**12.** මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධව අවසාන තීරණයක් ගැනීම තැපැල්පති සතු වන්නේය.

තැපැල්පති
තැපැල් දෙපාර්තමේන්තුව
ආර්. ඩබ්. එම්. ආර්. පී. සත්කුමාර
තැපැල්පති

2025 ජුනි මස.16.........දින
අංක 310, ඩී.ආර්.විජේවර්ධන මාවත
කොළඹ 10

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියදුරු (විවෘත) තනතුරු සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය - 2025**

**Practical Test for the Recruitment of Grade III Postal Drivers (Open) Posts in the Primary Level Skilled Category of the Postal Department of Sri Lanka – 2025**

භාෂා මාධ්‍යය ☐

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

**1.** i. මුලකුරු සමඟ නම:
සිංහලෙන්/දෙමළෙන්........................................................................................
........................................................................................
........................................................................................මයා
ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරෙන්) Mr........................................................................................
........................................................................................
........................................................................................

ii. සම්පූර්ණ නම:
සිංහලෙන්/දෙමළෙන්........................................................................................
........................................................................................
........................................................................................මයා
ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරෙන්) Mr........................................................................................
........................................................................................
........................................................................................

**2.** i. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
කැඳවීම් ලිපිය මෙම ලිපිනයට එවනු ලැබේ
........................................................................................
........................................................................................

ii. සිංහලෙන් / දෙමළෙන්.
........................................................................................
........................................................................................

**3.** i. ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐

ii. උපන් දිනය :- වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

iii. 2025.07.25 දිනට වයස :- අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

**4.** දුරකථන අංකය:- ජංගම ☐☐☐☐☐☐☐☐☐☐
(WhatsApp No) ☐☐☐☐☐☐☐☐☐☐

5. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද? ඔව් ☐ නැත ☐
(සුදුසු තැන X කතිර සළකුණ යොදන්න)

6. අධ්‍යාපන සුදුසුකම් : -

6.1. අ.පො.ස. (සා.පෙළ) : පළමු වර

වර්ෂය ...................... විභාග අංකය ..................................

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

6.2. අ.පො.ස. (සා.පෙළ) : දෙවැනි වර

වර්ෂය ...................... විභාග අංකය ..................................

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

7. වෘත්තීය සුදුසුකම් :

i. රියැදුරු බලපත්‍ර අංකය ................................
ii. නිකුත් කළ දිනය........................................
iii. D පන්තියේ (බර වාහන) රියැදුරු බලපත්‍රය ලබා ගත් දිනය ........................
(බර වාහන රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් අමුණන්න)

8. කායික සුදුසුකම් :

අයදුම්කරුගේ උස : - අඩි ............... අඟල් ............ (සෙ.මි. ..............)

9. වෙනත් සුදුසුකම් :

.......................................................................................................................
.......................................................................................................................
.......................................................................................................................

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ X ලකුණ යොදන්න)

ඔව් නම් , ඒ සම්බන්ධ තොරතුරු සඳහන් කරන්න.

.......................................................................................................................
.......................................................................................................................

**11.** පරීක්ෂණ ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :.......................................................................
කුවිතාන්සි අංකය :.......................................................................
දිනය :.................................

පරීක්ෂණ ගාස්තු ගෙවූ කුවිතාන්සිය නොගැලවන සේ මෙහි අලවන්න

**12. අයදුම්කරුගේ ප්‍රකාශය :**

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, සඳහන් කරමි. මෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙරාතුව සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු වරද අනාවරණය වූයේ නම් වන්දියක් නොමැතිව වහාම මා සේවයෙන් පහ කළ හැකි බවත්, මම හොඳාකාරව දනිමි.

තවද, ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් තැපැල්පති විසින් පනවනු ලබන නීතිරීති වලට යටත් වන බවද, මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරන බවද ප්‍රකාශ කරමි.

දිනය : - ...............................

.................................................
අයදුම්කරුගේ අත්සන

**13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................................................................................මහතා මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු මා ඉදිරිපිටදී ............................ දින ඔහුගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

දිනය .......................................

.....................................................
සහතික කරන්නාගේ අත්සන

නම :
තනතුර :
ලිපිනය :
නිල මුද්‍රාව :

**14. ආයතන ප්‍රධානියාගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා )**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මහතා මෙම ආයතනයේ ............................................... දින සිට ............................ තනතුරක සේවය කරන බවද, මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් **නිදහස් කළ හැකි / කළ නොහැකි බවද** ඔහු මෙතෙක් මොනයම් හෝ ආකාරයක විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය : - .........................

.............................................................
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :
තනතුර :
ලිපිනය :
නිල මුද්‍රාව :